## මහියංගනය ප්‍රාදේශීය සභාව

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 සැප්තැම්බර් 24 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 දෙසැම්බර් 14 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ කාර්ය සාධනය පිළිබඳ විගණන වාර්තාව 2012 සැප්තැම්බර් 24 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

### 1.2 ගනුදෙනු, මෙහෙයුම් හා කාර්ය සාධනය පිළිබඳ අදහස් දැක්වීම

### 1.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

2012 මැයි 31 දින වන විට විගණන විමසුම් 03 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

### 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 ආදායම් පරිපාලනය

### 2.1.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂය | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i) | වරිපනම් හා බදු | 5,386 | 1,791 | 3,595 |
| (ii) | බදු කුලී | 6,891 | 6,777 | 118 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,111 | 2,111 | - |

### 2.1.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | ගණනය කර නොතිබුණි. |
| (ii) | මුද්දර ගාස්තු | 1,581,835 |

2.1.3 කඩ කාමර කුලී

(අ) සභාව සතු කඩ කාමර 81 ක් සඳහා තක්සේරු කුලියට වඩා අඩුවෙන් මාසික කඩ කුලිය අයකිරීම නිසා 2009 ජූලි 01 සට 2011 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය තුල සභා අරමුදලට රු.7,578,000 ක අලාභයක් සිදුව තිබුණි.

(ආ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති 1980/46 දරන චක්‍රලේඛයේ 7 වන වගන්තියේ විධිවිධාන වලට පටහැනිව සභාව සතු කඩ කාමර 02 ක් බදුගත් බදුකරුවන් විසින් එම කඩ කාමර වෙනත් පාර්ශ්වයන්ට අතුරු බදු දී තිබුණි.

2.1.4 වෙනත් ආදායම්

සභාව විසින් පාලනය කරන නිවාඩු නිකේතනයේ සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම රු.152,750 ක් ද වියදම රු.948,149 ක් ද වූයෙන් සමාලෝචිත වර්ෂය තුලදී සභා අරමුදලට රු.795,399 ක මූල්‍ය පාඩුවක් සිදුව තිබුණි.

## 2.2 නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

යුධ හමුදා ක්‍රියාත්මක රාජකාරි සඳහා ගෙන ගොස් 2011 ඔක්තෝබර් 11 වැනි දින නැවත සභාව විසින් භාරගෙන තිබූ කැබ් රථයක් 2012 ජූනි මස වන විටත් අවශ්‍ය පරිදි අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

## 2.3 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඔ) වගන්තියට පටහැනි ලෙස අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන අවස්ථා 02 කදී ස්වේච්ඡා ආයතන වෙත ද්‍රව්‍යාධාර ලබාදීම සඳහා සභා අරමුදලින් රු.55,690 ක් වැයකර තිබුණි.

(ආ) ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවරා තිබුණ ප්‍රාදේශීය සභාවල කණිෂ්ඨ සේවකයින් බඳවා ගැනීමේ බලතලවලට අනුව පළාත් පාලන කොමසාරිස්වරයාගේ පූර්ව ලිඛිත

අනුමැතිය ලබා නොගෙන අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සභා ලේකම්වරයා විසින් පත්වීම් ප්‍රදානය කරන ලද කණිෂ්ඨ සේවකයින් 19 දෙනෙකු සඳහා 2011 ජනවාරි 01 සිට 2011 මැයි 31 දින දක්වා රු.1,427,120 ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

## 2.4 අවිධිමත් ගනුදෙනු

ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 12:5:2 වගන්තියේ විධිවිධාන වලට පටහැනි ලෙස සභාවේ තනතුරක වැඩ බලන නිලධාරියෙකුට අවස්ථා 02 කදී වැඩ බැලීමේ අතිරේක පාරිශ්‍රමිකය ලෙස රු.26,178 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.